**වැලිකන්ද ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

  - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

  - භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

  - මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය සමඟ ඉදිරිපත් කළ පරිශිෂ්ඨය 02 අනුව පුස්තකාල පොත් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට මඟපෙන්වීම් කර තිබූ නමුත් සභාව විසින් පුස්තකාල පොත් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි | ඉදිරියේදි පුස්තකාල පොත් ජංගම වත්කම් යටතේ ගිණුම් ගත කිරිමට අවශ්‍ය කටයුතු කරමි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 96 අනුව පෙර වර්ෂයට අදාළ සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මෙම වසරේ සිට පෙර වර්ෂයට අදාල සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සමඟ ඉදිරිපත් වූ පරිශිෂ්ඨය 02 හි EG 2.7 ප්‍රාග්ධන වියදම් ප්‍රදාන යටතේ රජයෙන් සහ පළාත් පාලන ආයතන වලින් ලැබූ සියළු ප්‍රදාන ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ විවෘත කළ යුතු නව ගිණුමකට හර කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලද රු.13,765,826 ක ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදි ඇතුලත් කිරිමට කටයුතු කරමි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | LDSP ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත මිළදීගෙන තිබූ ස්ථාවර වත්කම් අයිතම 06 ක රු.1,688,078 ක වටිනාකම හා ජංගම වත්කම් අයිතම15 කරු.1,822,260ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | සියළු වත්කම් ලේඛනගත කරන ලදි. | සියලු වත්කම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් මිළදීගත් ප්‍රති ආශ්‍රුත ජල පෙරණයේ වටිනාකම රු.935,000 ක් වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ලේඛනගත කරන ලදී. | වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය විමසා සභාවට අයත් ආදායම් හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු ආදායම රු.2,836,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වටිනාකම රු.306,000 ක් වූයෙන් මුද්දර ගාස්තු ආදායම රු.2,530,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන දින වන විට දී අදාල තොරතුරු ලැබී නොතිබූ බැවින් ඊට අදාල ඇස්තමේන්තුගත මුදලක් මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කර තිබුණි. | ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී නව ජල සම්බන්ධතා ලබාදීම සඳහා වැය කළ රු.1,068,500 ක වියදම ප්‍රාග්ධනිත නොකර වියදම් ලෙස කපාහැර තිබුණි. | රු.1,068,500ක වියදම පී වී සී බට මිලදී ගැනීමට යොදවා ඇති අතර එම වියදම් 2021 අයවැය යටතේ පුනරාවර්ථන වියදම ලෙස වෙන්කර ඇති අතර එම නිසා මෙම වියදම් පුනරාවර්තන ලෙස සඳහන් කර ඇත. | ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්ථන වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | කොවිඩ් පාලන ඇමතුම් මධ්‍යස්ථානය සඳහා මිළදීගෙන තිබූ රු. 36,395 ක් වූ රූපවාහිනි යන්ත්‍රයක් හා උපාංගද, 2021 ඔක්තෝබර් මාසයේදී මිළදීගෙන ගබඩාවේ තිබූ රු.316,000 ක් වටිනා ටැබ් යන්ත්‍ර 08 ක් ද මූල්‍ය ප්‍රකාශනවල වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | * මිලදී ගෙන තිබූ රු.32,950 ක් වටිනා රූපවාහිනි යන්ත්‍රය ස්ථාවර වත්කම් ලේඛනයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේත්, 2021 ඔක්තෝම්බර් මාසයේදී මිලදී ගෙන ගබඩාවේ තිබූ ටැබ් යන්ත්‍ර 08 පරිගණක උපාංග යටතේත් ලේඛනගත කරන ලදී. | වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | 2021 වර්ෂය සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 ක කෙරීගෙන යන වැඩ වටිනාකම රු.1,921,346 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | කෙරිගෙන යන වැඩ වටිනාකම ඉදිරියේදී ඇතුලත් කිරිමට කටයුතු කරමි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආයභාරය රු.9,894,878 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආයභාරය රු.882,185 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නෙළුම්වැව ගම්මානයේ සතිපොළ භූමියේ ඉදිකර තිබූ රු.1,236,921 ක් වටිනා නොදිරන කසල ගබඩාව සම්බන්ධ විස්තර ප්‍රාදේශීය සභාවේ ලේඛනගත කර නොතිබූ අතර සතිපොළ සඳහා ඉදි කර තිබූ ගොඩනැගිලි 03 හා කසළ ගබඩාව 2022 අගෝස්තු වන විටත් සැලසුම් කරන ලද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | සැලසුම් කරන ලද ව්‍යාපෘති වාර්තාව මගින් අදාල ගොඩනැගිලි භාවිත කිරිමට අදහස් කර ඇත | වත්කම් ලේඛනගත කිරීමටත්, උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී කම්කරුවන් 04 දෙනෙකු හා යන්ත්‍රෝපකරණ 02 ක් වෙනුවෙන් පිළිවෙලින් රු. 948,700 ක හා රු.354,053 ක වියදමක් දරා සභා බල ප්‍රදේශයේ වාර්ෂිකව ජනනය වන ටොන් 312 ක් පමණ වූ කසල ප්‍රමාණයක් සභාව සතු ඇතුගල පිහිටි අපහරණ භූමිය වෙත බැහැර කර තිබුණද, දිරන කසල භාවිතා කර කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි. | දිනපතා බැහැර කරන කසළ සතියකට වරක් වල දැමීම සිදුකරයි. | පරිසරයට හා වන සතුන්ට හානි නොවන අයුරින් අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුවේ. |